# ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

# වාර්ෂික වාර්තාව




# 2014

# පටුන



| මාතෘකාව | පිටු අංකය |
|---|---|
| දැක්ම සහ මෙහෙවර | 3 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 4 |
| සභාපතිනියගේ සමාලෝචනය | 6 |
| මණ්ඩලයේ තොරතුරු | 7 |
| සමස්ථ කාර්ය සාධනය 2014 | 8 |
| මූල්‍ය ප්‍රකාශනය | 11 |
| විගණකාධිපති වාර්තාව | 26 |

# 2014 - වාර්ෂික වාර්තාව

**දැක්ම**

ගොවි ජනතාවගේ සහ අඩු වරප්‍රසාද ඇති ජනතාවගේ අභිමානය නැවතත් ඇති කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම මගින් ආර්ථික ස්වාධීනත්වය සහ ස්ව විශ්වාසය ඇති කිරීම'

**මෙහෙවර**

ප්‍රතිලාභීන් ගේ ආර්ථික ස්වාධීනත්වය ඇති කිරීමටත් අනුන් මත යැපීමේ සංස්කෘතිය මග හැරවීම සඳහාත් කෘෂිකර්ම, පශු සම්පත් සහ වෙනත් ක්ෂේත්‍ර වල නිපුණතා සංවර්ධනය සඳහා සහභාගීත්ව සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

# 2014 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය

| නම | තනතුර | සේවා ස්ථානය |
|---|---|---|
| කුමුදුණී ගුණසේකර මිය | සභාපතිනිය | ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය |
| බී. හෙට්ටිආරච්චි මයා | උප සභාපති | ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය |
| එස්. සුරවීර මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) | වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය |
| කේ. රණසිංහ මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) | රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
| ඩී.එන්. හෙට්ටිආරච්චි මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| ආර්. එදිරිසිංහ මිය | අධ්‍යක්ෂ (සැලසුම්) | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| ඩබ්.එච්.ජී. කෝසල මයා | සහකාර අධ්‍යක්ෂ | කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව |
| ජී.ජී. බන්දුල මයා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | චාන්දනී, කින්චිගුණේ, මැදමූලන |
| එස්. අබේසිංහ මයා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ශක්ති, මහා අධිකරණය අසල, ගල්දොල, කොටපොල |
| රශ්මි ජයසිංහ මයා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 10, මහවෙල පාර, දික්වැල්ල |

## 2014 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය පැවැත්වූ දිනයන්

355 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2014.01.30

356 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2014.03.06

357 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2014.04.25

358 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2014.05.19

359 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2014. 07.18

360 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2014.09.25

361 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2014.11.27

362 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2014.12.22

2014 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල පැවැත්වූ දින ගණන = 08

**සභාපතිනියගේ සමාලෝචනය**

ජාතික ආහාර ප්‍රවර්ධණ මණ්ඩලයේ සභාපති ලෙස වසර 04 ක් සක්‍රිය සේවයේ යෙදී සිට 2014 වසරේ වාර්ෂික වාර්තාව සඳහා සමාලෝචනාත්මක කාර්ය සාධනයක් ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයකි.

මහින්ද චින්තන ඉදිරි දැක්ම පෙරටු කර ගත් ස්ථාපිත පනතේ අන්තර්ගත අරමුණු වලට සමගාමීව යමින් අප මණ්ඩලය 2014 වසරේ පහත ව්‍යාපෘතින් මගින් ශ්‍රී ලාංකේය ගොවි ජනතාවට මෙන්ම නාගරික හ ග්‍රාමීය ප්‍රජාවගේ දෛනික ජන ජීවිතය සඳහා අත්වැලක් සැපයිමට හැකියාව ලැබී ඇත. මෙහිදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයන්ට අනුව අප මහින්ද යාපා අබේවර්ධන - කෘෂිකර්ම අමාත්‍යතුමාගේ මග පෙන්වීම අගය කල යුතුව ඇත.

1. ප්‍රායෝගික වැඩමුළු සහ වැඩසටහන් සහිත දේශීය ආහාර ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය
2. සුවපෝෂ පෝෂණීය ආහාර නිෂ්පාදනය සහ ප්‍රවර්ධන ව්‍යාපෘතිය
3. වතුකරයේ සහල් පිටි, තෝසේ පිටි නිෂ්පාදන ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය
4. දේශීය පාරම්පරික සහල් නිෂ්පාදනය හා පාරිභෝජනය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය
5. වස විස නැති අපේ ආහාර - සුවදැල් ස්ලෝ ෆුඩ් ව්‍යාපෘතිය
6. පෝෂණ මල්ල වැඩසටහන - අඩු බර සහිත ගර්භණී මව්වරුන් සඳහා
7. ගොවි නිෂ්පාදන අලෙවිසැල් ව්‍යාපෘතිය
8. බුත්තල, තණමල්විල සහ අම්බලන්තොට ගොවිපල සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතීන්ට අමතරව පූර්වගාමී ව්‍යාපෘතින්ද සංවර්ධනය කරමින් නූතන සමාජ අව්‍යතාවන්ට අනුව යාවත්කාලීන කිරීම සිදුකර ඇත. විශේෂයෙන් දෙහිවල සහ නාරාහේන්පිට ගොවි නිෂ්පාදන අලෙවි සැල් තුලින් ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ නිෂ්පාදන සඳහා ප්‍රධාන ගැටළුවක්ව පවතින වෙළඳපල සොයා ගැනීම සහ නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමේ ගැටළුව සඳහා තිරසාර විසඳුම් ලබා දීමට හැකිවීමත්, නාගරික ප්‍රජාවට ගුණාත්මයෙන් ඉහළ, සාධාරණ මිලකට නැවුම් භාණ්ඩ ලබා ගැනීමට හැකිවීමටත් මෙමගින් මඟ පෑදී ඇත.

තවද දෙහිවල සහ නාරාහේන්පිට නාගරික ප්‍රදේශ තුල පැල තවාන් ඇති කිරීමෙන් නාගරික ජනතාවට අඩු ඉඩකඩක් තුල වැඩි ඵලදාවක් ලැබෙන බෝග සහ පළතුරු පැළ වර්ග මිළදී ගැනීමටත්, වගාවන් සිදු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීමේ සේවාවන්ද ඉටු කරයි.

අපගේ කලංකුට්ටිය සහ ගන්නෝරුව පිහිටි නිෂ්පාදනාගාර මගින්, වස විස නැති දේශිය සහල්, තෝසේ පිටි, විශේෂිත සහල් පිටි, මව්පෝෂ, සුවපෝෂ, සිසුපෝෂ වැනි නිෂ්පාදන වෙළඳපලට ඉදිරිපත් කිරීමට හැකියාව ලැබී ඇත. මෙතුලින් ශ්‍රී ලාංකීය ජනතාවගේ පෝෂණය ඉහළට නැංවීමට හැකියාව ලැබී ඇත.

දේශීය පාරම්පරික වී වර්ග ගොවීන් සඳහා හඳුන්වා දීමෙන් ඉතා අඩු නිෂ්පාදනයක් සහිතව පැවති වඳවී යන පාරම්පරික වී වර්ග ව්‍යාප්තිය වැඩි කිරීමටත්, එතුලින් පාරම්පරික වී නිෂ්පාදනය වැඩිකර ලාභදායි ව්‍යාපාරයක් ලෙස පෞද්ගලික අංශයට හඳුන්වාදීමේ හැකියාව ලැබී ඇත. තවද පාරම්පරික වී සඳහා හොඳ වෙළඳපලක් සහ රු. 80 සිට 90 දක්වා ඉහළ අගයක් ලැබීමට හැකියාව ලැබී ඇත.

තවද 2014 වසර තුල ජාතික ප්‍රදර්ශන සඳහා ආයතනයේ සක්‍රිය දායකත්වය ලබා දී ඇත. විශේෂයෙන් කුරුණෑගල, කුලියාපිටියේ පැවති දැයට කිරුළ ජාතික ප්‍රදර්ශණය සඳහාද, වාරියපොල පැවති ජාතික ගොවි සතිය ප්‍රදර්ශනය සඳහාද, බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවති හෙල්ත් කෙයා ප්‍රදර්ශනය සඳහාද, ප්‍රෝ ෆුඩ් ප්‍රෝ පැක් ජාත්‍යන්තර ප්‍රදර්ශනය, පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළු ප්‍රදර්ශනය සඳහාද, ශිල්ප 2014 ප්‍රදර්ශනය සඳහාද අප ආයතනය සහභාගී වී ඇත.

2014 වර්ෂය තුල අප මණ්ඩලයේ නිලධාරීන්ගේ හා සේවකයන්ගේ කාර්ය සාධනය වැඩි කරනු වස් පුහුණු වැඩ සටහන්, සිංහල අළුත් අවුරුදු උත්සව සැමරීම්, පිරිත් දේශණා ආදී ආගමික කටයුතු, රැකියාවේ උසස්වීම් ලබා දීම් ආදිය සිදුකොට ඇත. මෙවැනි දේ සිදු කිරීම මගින් සේවක අභිප්‍රේරණය වැඩි කිරීම තුලින් ආයතනයේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩි කිරීමට කටයුතු සිදුකර ඇත.

මෙයට අමතරව 25/2014 චක්‍ර ලේඛයට අනුව ආයතනයේ සේවයකල සේවකයන් 52 ක් ස්ථිර කිරීමද සිදුකොට ඇත.

කුමුදුණී ගුණසේකර
සභාපතිනිය
**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය**

## මණ්ඩලයේ තොරතුරු

**මණ්ඩලයේ නම:**
ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය (පෙර ශ්‍රී ලංකා ජාතික නිවීමේ ව්‍යාපාර මණ්ඩලය)

**පිහිටි ස්ථානය සහ නීතිමය ස්වරූපය:**
1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ පනත මගින් ස්ථාපිත කර ඇත. 2009 වසරේ ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය ලෙස නම වෙනස් කිරීමට කැබිනට් අනුමැතිය ලැබුනි. ප්‍රධාන කාර්යාලය කොළඹ 5, කිරිමණ්ඩල මාවතේ අංක 45 හි පිහිටා ඇත.

**මූලික ක්‍රියාකාරකම් සහ අරමුණු:**
ප්‍රධාන ලෙස ආර්ථික අසාධාරණත්වයට භාජනය වූ ජනතාවට සේවය සපයන ආයතනයකි. අරමුණු වන්නේ;

- රජය විසින් සකස් කරන ලද සංවර්ධන වැඩ පිළිවෙලට අනුකූලව සාමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා විදේශීය, දේශීය නියෝජ්‍යාත්ව වල ආධාර ලබා ගැනීම
- මහජනෝපකාර සාමාජීය හා ආර්ථික සංවර්ධනය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ආයතනවලට හා වෙනත් මණ්ඩලවලට සහාය වීම
- කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනය කෙරෙහි යොමු වූ නිශ්චිත යෝජනා ක්‍රමවලට ආධාර කිරීම එම යෝජනා ක්‍රම දියුණු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම
- කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වූ යෝජනා ක්‍රියාත්මක කිරීමෙහිලා ආණ්ඩුවේ නොවූ නියෝජ්‍යාත්ව උනන්දු කිරීම
- ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාරය සහ වෙනත් ඒ හා සමාන පිටරට ආයතන, සංගම් හෝ සමිති සමග සහයෝගී වීම

**රේඛීය අමාත්‍යාංශය**
කෘෂිකර්ම අමාත්‍යාංශය

**කාර්යාලය:**
අංක 45, කිරිමණ්ඩල මාවත, කොළඹ 5
දුරකථනය: 0112506895
ෆැක්ස්: 0112506907
ඉ. ලිපිනය: ffhc.srilanka@gmail.com

**විගණකවරු:**
විගණකාධිපති දෙපාර්තමේන්තුව

**බැංකුකරුවන්:**
ලංකා බැංකුව - බොරැල්ල
මහජන බැංකුව - දෙහිවල

**උපාය මාර්ග:**

- සංවර්ධන මූලයන් සාමූහික අරමුණක් කෙරෙහි යොමු කිරීමට සමෝධානය කිරීම
- ගැමි ජනතාවට ආර්ථික සහ සමාජ වර්ධනයට, සහයෝගී වීම සඳහා අවස්ථාව ලබා දීම
- සංවර්ධන ක්‍රියාවලියට සහභාගීවීම සඳහා ගැමි ජනතාවට බලය ලබා දීම
- ස්වයං ප්‍රචලිත තිරසාර සංවර්ධනයක් ඇති කිරීම සඳහා පාරම්පරික ගැමි ජනතාවගේ ස්ව විශ්වාසය ඇති කිරීම සමග ලබා ගත හැකි අගයයන් වෙත වෙනස් කිරීම
- දේශීය ආහාර භාවිතය සහ නිෂ්පදනය ප්‍රවර්ධනය කිරීම
- පශු අස්වනු හානිය අවම කිරීමේ තාක්ෂණය බිම් මට්ටම තෙක් රැගෙන යාම

## සමස්ථ කාර්ය සාධනය - 2014

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය 2014 වසරේදී ව්‍යාපෘති 12 ක් සිදු කර ඇති අතර මෙම ව්‍යාපෘති වල සංෂිප්ත විස්තර පහත දැක්වේ.

**1. සුවපෝෂ පෝෂණීය ආහාරය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය**

සුවපෝෂ ධාන්‍යමය ආහාරය නිෂ්පාදන කර්මාන්තශාලාව ගන්නෝරුව ආහාර පර්යේෂණ ඒකකයේ පිහිටා ඇත. මේ වසර තුල සුවපෝෂ 200g පැකට් 157,466 ක් නිෂ්පාදනය කල අතර වියදම රු.මි. 7.16 වන අතර ආදායම රු.මි. 8.49 ක් වේ.

**2. අඩු බර ගර්භනී මව්වරුන් හට මව්පෝෂ පෝෂණීය ආහාරය**

මව්පෝෂ නිෂ්පාදන කර්මාන්තශාලාව ගන්නෝරුව ආහාර පර්යේෂණ ඒකකයේ පිහිටා ඇත. මේ වසර තුල මව්පෝෂ 1කි.ගෑ පැකට් 78,733 නිෂ්පාදනය කර ඇති අතර ඒ සඳහා වියදම රු.මි. 15.34 වැය වු අතර ආදායම රු.මි.19.2 කි.

**3. වතුකරයේ සහල්පිටි භාවිතය ප්‍රචලිත කිරිමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය මගින් විශේෂ සහල් පිටි මිශ්‍රණයක් සහ විශේෂ තෝසේ පිටි මිශ්‍රණයක් අප මණ්ඩලය මගින් නිෂ්පාදනය කර ඇත. මෙම නිෂ්පාදන කලංකුට්ටිය කර්මාන්ත ශාලාව තුල නිෂ්පාදනය කරන අතර විශේෂ සහල් පිටි මිශ්‍රණය සහ තෝසේ පිටි මිශ්‍රණය පැකට් 157,466 ක් නිෂ්පාදනය කර ඇති අතර ඒ සඳහා වියදම රු.මි. 12.8 ක් වන අතර ආදායම රු.මි. 14.37 කි.

**4. සිසුපෝෂ ධාන්‍යමය ව්‍යාපෘතිය හඳුන්වාදීම**

මෙය උතුරුමැද පළාත් පාසල් සිසුන්ගේ පෝෂණීය තත්වය ඉහල නැංවීම සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත නවතම ව්‍යාපෘතියකි.

**5. බුත්තල ගොවිපල සංවර්ධනය (අක්කර 10)**

2014 වසරේ මුල් මාස 6 තුල ආයතනයේ වියදමින් සුළු ප්‍රමාණයෙන් වගා කටයුතු සිදු කරන ලදි. අගෝස්තු මස සිට අමාත්‍යාංශයේ මුදල් ලැබුන නිසාවෙන් ක්‍රියාත්මක සැලැස්මක් අනුව වගා කටයුතු ආරම්භ කරන ලදි. ගොවිපල සතු කෘෂි ළිං දෙක ගැඹුරු කර අලුත්වැඩියා කිරීම සඳහා රු මිලි. 0.4739 ක වියදමක් දරා ඇත.

ගොවිපල වටා විදුලි අලි වැටක් ඉදි කර ඇති අතර ඒ සඳහා රු මිලි. 1.0173 ක මුදලක් වැය කර ඇත. ගොවිපල උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව සඳහා රු මිලි. 0.1870 මුදලක් වැය කර ඇත. මෙහි බඩ ඉරිගු අක්කර 3.5 ක ප්‍රමාණයක වගා කර ඇති අතර ඒ සඳහා රු .මි. 0.0356 ක මුදලක් වැය කර ඇත. අප්‍රේල් මස මුලදී එහි අස්වැන්න නෙලිය හැක.

එළවළු වගාව සඳහා රු.මි. 0.0578 මුදලක් වැය කර ඇති අතර එයින් පලමු වටයේ ආදායම ලෙස රු.මි 0.01654 ක මුදලක් ලබා ඇත. නැවත වාර කිහිපයක් අස්වනු නෙලිය හැක.

**6. තණමල්විල ගොවිපල සංවර්ධනය - අක්කර 16**

2014 වසරේ මුල් මාස 6 තුල ආයතනයේ වියදමින් සුළු ප්‍රමාණයෙන් වගා කටයුතු සිදු කරන ලදි. අගෝස්තු මස සිට අමාත්‍යාංශයේ මුදල් ලැබුන නිසාවෙන් ක්‍රියාත්මක සැලැස්මක් අනුව වගා කටයුතු ආරම්භ කරන ලදි. වී වගාවට අක්කර 8ක් වෙන් කල හැකි නමුත් වැවේ ජලය ප්‍රමාණවත්

නොවන නිසා මෙවර අක්කර 4.5 ක ප්‍රමාණයක් වගා කරන ලදි. සුවදැල් වී වර්ගය වගා කර ඇති අතර රු.මි. 0.14 මුදලක් වියදම් දරා ඇත.

මුරුංගා පැල 100 ක් සිටුවා ඇති අතර රු.මි 0.012 වියදම් කර ඇත. මෙම පැල මාස 2ක් පමණ වයස වේ. මෙහි කෙටි මුරුංගා විශේෂය යොදා ඇත.

බඩඉරිගු අක්කර 1 ක වගා කර ඇති අතර CIC ආයතනයෙන් බීජ ලබාගෙන ඇත. මේ සඳහා රු.මි 0.005 මුදලක් වැය කර ඇත. මාර්තු මස මුල් සතියේ අස්වනු නෙලයි. වට්ටක්කා හා මෑ කරල් අක්කර 0.25 බැගින් වගා කර ඇත. මේ සඳහා රු.මි 0.002 ක් වැය කර ඇත. බටු පැල තවාන් දමා ඇත. මීට අමතරව අඹ පැල 100 ක් සිටුවා ඇත.

යන්ත්‍ර සූත්‍ර අළුත් වැඩියාව යටතේ 5040 ට්‍රැක්ටරය සම්පූර්නයෙන් අළුත් වැඩියාව කොට ඇත. මේ සඳහා රු.මි 0.2209 මුදලක් වියදම් වී ඇත.

**7. ගොවි සතිය**

අමාත්‍යවරුන් අතුළු විශේෂ ආරාධිතයන්ට කෑම බීම සැපයිම සිදු කරන ලද අතර අප ආයතනයේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවිසැලැක් ද පවත්වනු ලැබීය. මේ සඳහා අමාත්‍යාංශයෙන් රු.මි. 0.8 ක් ලැබී ඇති අතර වියදම රු.මි. 1.06 කි.

**8. දැයට කිරුළ 2014 - කුලියාපිටිය**

මෙහිදී ආදර්ශ වැඩසටහන් පැවත්වූ අතර ඒ සඳහා රු මි.0.1 ද මුළු වියදම ලෙස දරා ඇත.

**9. පැළ තවාන - නාරාහේන්පිට**

නාගරික වැසියන්ට අවශ්‍ය සියළුම ගෙවතු සංවර්ධනයට අවශ්‍ය පැල, පොහොර, කෘෂි රසායන, මෙවලම් ආදිය සපයයි. මෙම වසරේ වියදම රු.මි. 6.102 වූ අතර ආදායම රු.මි. 6.128 කි.

**10. ගොවි නිෂ්පාදන අලෙවි සැල - දෙහිවල**

මෙහි සේවකයන් 18 ක් සේවය කරන අතර රු.මි.45.144 කි ආදයමක් උපයා ගෙන තිබූ අතර වියදම රු.මි. 42.87 ක් විය

**12. හෙල්දි ෆුඩ් භෝජනාගාරය - නාරාහේන්පිට**

මෙහි සේවකයන් 14 ක් සේවය කරන අතර වියදම රු.මි. 18.09 ක් වූ අතර ආදායම රු.මි.16.4 කි. මෙම භෝජනාගාර ඉතා ජනප්‍රිය තත්වයට පත්ව ඇති අතර වියදම අඩු කිරීම සඳහා කටයුතු යොදා ඇත.

**12. දේශීය ආහාර ප්‍රවර්ධන වැඩසටහන (දිස්ත්‍රික් හා ප්‍රාදේශිය වැඩසටහන්)**

මෙම වැඩසටහන් මාලාව දිවයින පුරා දිස්ත්‍රික්ක 05 ක් ආවරණය වන පරිදි පැවැත්වනු ලැබීය. මෙම වැඩසටහන් මාලාව මගින් දේශීය ආහාර රට තුල ප්‍රචලිත කිරීම මගින් මන්දපෝෂණය සහ කෘතිම ආහාර භාවිතය අවම කිරීම, දේශීය කෘෂිකර්මාන්තය දිරිමත් කිරීම, දේශීය ආහාර වල ඇති සෞඛ්‍යාරක්ෂිත බව හා ගුණාත්මක භාවය පිළිබඳ ගෘහනියන් දැනුවත් කිරීම, බෝ නොවන රෝග පිටු දැකීමට අවශ්‍ය පසුබිම අවබෝධ කරවීම, ගෙවතු වගාවට කාන්තාවන් නැඹුරු කරවීම හා ස්වයං රැකියා සඳහා කාන්තාවන්ට අවශ්‍ය මූලික අවශ්‍යතා සපයාදී ඒ සඳහා ඔවුන් යොමු කිරීම ප්‍රධාන අරමුණු ලෙස සිදු කරනු ලැබීය.

මෙහි ක්‍රියාකාරකම් ලෙස සහභාගීවන්නන්ට සුවපෝෂ හා සහල් පිටි පැකට් බෙදා දීම, දේශීය ආහාර පාන ප්‍රායෝගිකව සකස් කිරීම, ආහාර වට්ටෝරු ඇතුලත් පොත් පිංච පිලයෙල කිරීම, ප්‍රවාහණය, සංවිධායකයින්ගේ ආහාර පාන සහ නවාතැන් පහසුකම්, බාහිර දේශකවරුන්ගේ දේශන පැවැත්වීම හා උදව් කරුවන්ගේ ගෙවීම් ආදිය ඇතුලත් වේ. 2014 වසරේ දරා ඇති මුළු වියදම රු.මි. 5.23 ක් වන අතර ප්‍රතිලාභීන් සංඛාව 20,750 ක් වේ. මෙම වැඩසටහන් මාලාව මාතර, හම්බන්තොට, කිළිනොච්චි, පොළොන්නරුව හා කොළඹ යන දිස්ත්‍රික්කයන් තුල, දිස්ත්‍රික් වැඩසටහන් 34 ක් හා ප්‍රදේශිය වැඩසටහන් 105 ක් ලෙස පවත්වනු ලැබීය.

13. භාණ්ඩාගාර ප්‍රතිපාදන

| | අයවැය ප්‍රතිපාදන 2014 (රු.මි.) | ලැබුන ප්‍රධානයන් (රු.මි.) | සත්‍ය වියදම (රු.මි.) | වැඩි වියදම (රු.මි) |
|---|---|---|---|---|
| පුනරාවර්තන | 15.00 | 16.50 | 19.10 | 2.60 |
| ප්‍රාග්ධන | 5.00 | 5.00 | 5.23 | 0.23 |
| එකතුව | 20.00 | 21.50 | 24.33 | 2.83 |

# 2014 වාර්ෂික ගිණුම් වාර්තාව

**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය**

මෙම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සාමාන්‍ය පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සකස් කර ඇති අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, ඓතිහාසික පිරිවැය පදනම මත සහ අඛණ්ඩ පැවැත්ම පදනම මත පිහිටා සකස් කර ඇත.

**ගිණුම්කරණ ප්‍රතිපත්ති:**

1. වත්කම් වල නව මිලදී ගැනීම් මිලදී ගත් වටිනාකමටද (පිරිවැයට) අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණන වටිනාකමටද (සාධාරණ අගයට) පෙන්වා ඇත.
   ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්, වත්කම් වල ඵලදායි ජීවිත කාලය පුරා ක්ෂය කරනු ලබන අතර ප්‍රත්‍යාගණන දිනට පෙර පැවති වටිනාකම පහත සඳහන් ක්ෂය ප්‍රතිශතයන්ට ක්ෂය කර ඇත.
   පහත සඳහන් ක්ෂය ප්‍රතිශතයන්ට ක්ෂය ගණනය කර ඇත්තේ වත්කම් මිලදී ගත් දින සිට ප්‍රත්‍යාගණනය කරන ලද දින දක්වා වේ.

   **ක්ෂය කිරීමේ අනුපාත**

   | | |
   |---|---|
   | ඉඩම් සහ ගොඩනැගිලි | 5% |
   | මෝටර් වාහන | 20% |
   | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 10% |
   | යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍ර සූත්‍ර | 20% |
   | ඡායාරූප සහ සිනමා උපකරණ | 10% |
   | කෘෂිකාර්මික උපකරණ | 20% |
   | උද්‍යාන උපකරණ | 10% |
   | වෙනත් උපකරණ හා වෙනත් ආයෝජන | 20% |
   | කාර්යාලීය උපකරණ | 10% |
   | සුළු උපකරණ සහ මිනුම් උපකරණ | 20% |
   | තාවකාලික ගොඩනැගිලි | 5% |
   | පරිගණක හා මෘදුකාංග | 20% |

2. ලැබිය යුතු ශේෂ, බොල් සහ අඩමාන ණය සඳහා වෙන්කල පසු ශුද්ධ වශයෙන් ලැබිය යුතු මුදලට ගිණුම් ගතකර ඇත.

3. හඳුනාගත් සියළුම වගකීම් සඳහා වෙන් කිරීම් කර ඇත.

4. පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් ගණනය කර ඇත්තේ පාරිතෝෂිත හිමි එක් එක් සේවකයන්ගේ වර්ෂ පදනම් කර ගනිමිනි.
5. වියදම් ඉක්මවා ගිය ආදායම් ගණනය කර ඇත්තේ දන්නා සියළුම වගකීම් සඳහා වෙන් කිරීම් සිදු කල පසුවය.

6. තොග ගණනය කරනු ලබන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගයට වන අතර, පහත සඳහන් තොග සඳහා පිරිවැය පහත සඳහන් ක්‍රම යටතේ ගණනය කරනු ලබයි.

    a. අමු ද්‍රව්‍ය - ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමයට සත්‍ය පිරිවැයට පෙන්වනු ලබයි.
    b. නොනිමි තොග - සෘජු අමුද්‍රව්‍ය පිරිවැයට පෙන්වනු ලබයි.
    c. නිමි තොග - සෘජු අමුද්‍රව්‍ය, විචලන පොදුකාර්ය පිරිවැය සහ සෘජු වැටුප් සත්‍ය පිරිවැයට පෙන්වනු ලබයි.
    d. පාරිභෝගික ද්‍රව්‍ය - සත්‍ය පිරිවැය පෙන්වනු ලබයි.

7. රජයෙන් ලද ප්‍රතිපාදන ආදායම් ප්‍රකාශනයේ ආදායමක් ලෙස වෙනමත් වියදම් අයිතමයන් වෙනමත් ඉදිරිපත් කර ඇත.

**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය**

2014 වර්ෂය තුලදී ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

| ව්‍යාපෘතිය | අරමුදල් ලබා දුන්නේ | ව්‍යාපෘතිය පිහිටි ස්ථානය |
|---|---|---|
| ගොවිපල සංවර්ධනය - තණමල්විල | ස්ව අරමුදල් සහ කෘෂිකර්ම අමාත්‍යාංශය | තණමල්විල |
| ගොවිපල සංවර්ධනය - බුත්තල | ස්ව අරමුදල් සහ කෘෂිකර්ම අමාත්‍යාංශය | බුත්තල |
| දේශීය ආහාර ප්‍රචලිත කිරීම | කෘෂිකර්ම අමාත්‍යාංශය | විවිධ දිස්ත්‍රික්කයන්හි |
| පැල තවාන - ප්‍රධාන කාර්යාලය | ස්ව අරමුදල් | නාරාහේනපිට |
| ගොවිපල සංවර්ධනය - අම්බලන්තොට | ස්ව අරමුදල් | අම්බලන්තොට |
| වතුකරයේ සහල් පිටි පාරිභෝජනය ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන | ස්ව අරමුදල් | කළුකුට්ටිය |
| සුවපෝෂ පෝෂණ පැකට්ටුව | ස්ව අරමුදල් | ගන්නෝරුව |
| මව්පෝෂ පෝෂණ පැකට්ටුව | ස්ව අරමුදල් | ගන්නෝරුව |
| කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම | ස්ව අරමුදල් | බුත්තල |
| ගොවි නිෂ්පාදන අලෙවි සැල-දෙහිවල | ස්ව අරමුදල් | දෙහිවල |
| හෙල්දිි ඵුඩ් භෝජනාගාරය | ස්ව අරමුදල් | නාරාහේන්පිට |

1. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය යටතේ පහත සඳහන් ජංගම ගිණුම් මෙම වසරේදී පවත්වාගෙන යන ලදී.

   ගිණුම් අංක 194125 මහජන බැංකුව -
   භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන
   කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලැබෙන ප්‍රතිපාදන, ගොවිපල සංවර්ධනය - බුත්තල, ගොවිපල සංවර්ධනය - තණමල්විල, අම්බලන්තොට ගොවිපල, සුවපෝෂ ව්‍යාපෘතිය, මව්පෝෂ ව්‍යාපෘතිය, වතුකරයේ සහල් පිටි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, පැල තවාන, දෙහිවල අලෙවි සැල, හෙල්දිි ඵුඩ් භෝජනාගාරය, කොම්පෝස්ට් ව්‍යාපෘතිය

   ගිණුම් අංක 138295 ලංකා බැංකුව - දෙහිවල අලෙවිසැලේ ආදායම

2. සෑම ව්‍යාපෘතියක් සඳහාම වෙන වෙනම ලෙජර් පවත්වාගෙනු යනු ලබයි.

## ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය
## 2014 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| විස්තරය | සටහන | 2014 රු. | 2013 රු. |
|---|---|---|---|
| ***වත්කම්*** | | | |
| ***ජංගම නොවන වත්කම්*** | | | |
| **දේපල පිරියත සහ උපකරණ** | 1 | ***343,497,339.56*** | ***17,652,871.01*** |
| ඉඩම් | | 307,200,000.00 | |
| ගොඩනැගිලි | | 13,039,577.17 | 4,759,997.85 |
| මෝටර් වාහන | | 8,707,000.00 | 2,381,167.56 |
| යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍ර සූත්‍ර | | 3,371,800.00 | 4,429,459.21 |
| ලී බඩු සහ සවිකිරීම් | | 1,328,520.00 | 747,777.27 |
| කාර්යාල උපකරණ | | 2,016,165.50 | 1,376,385.55 |
| කෘෂිකාර්මික උපකරණ | | 639,500.00 | 29,520.45 |
| උද්‍යාන උපකරණ | | - | 61,102.91 |
| වෙනත් උපකරණ | | 2,439,350.00 | 583,811.50 |
| ඡායාරූප සහ සිනමා උපකරණ | | 3,540.00 | 26,310.00 |
| පරිගණක උපාංග | | 1,292,160.00 | 2,077,363.68 |
| තාවකාලික ගොඩනැගිලි | | 2,239,986.89 | 1,129,224.26 |
| වෙනත් ආයෝජන | | - | 50,750.77 |
| මිනුම් උපකරණ | | 130,740.00 | - |
| **අස්පෘශ්‍ය වත්කම්** | | | |
| මෘදුකාංග | | 1,089,000.00 | - |
| | | | |
| **නොනිමි වැඩ** | | | ***300,000.00*** |
| නව ගොඩනැගිල්ල සඳහා වන ප්‍රාථමික වියදම් | | - | 300,000.00 |
| **මූල්‍ය වත්කම්** | | ***1,028,801.48*** | ***527,034.99*** |
| තැන්පතු | | 948,190.98 | 409,934.08 |
| ණය | | 80,610.50 | 117,100.91 |
| ***ජංගම වත්කම්*** | | ***11,293,963.97*** | ***7,629,726.43*** |
| තොගය | | 9,609,552.48 | 4,475,149.96 |
| ණය ගැතියන් | | 999,476.77 | 1,288,973.30 |
| අත්තිකාරම් | | 33,400.00 | 798,215.52 |
| ලැබිය යුතු | | 581,768.31 | 67,282.50 |
| අතැති සහ බැංකු මුදල් | | 69,766.41 | 1,000,105.15 |
| **මුළු වත්කම්** | | **355,820,105.01** | **26,109,632.43** |
| ***හිමිකම් හා වගකීම්*** | | | |
| ***ප්‍රාග්ධනය සහ සංචිත*** | | ***343,255,663.66*** | ***13,244,656.36*** |
| අරමුදල් ශේෂය | | 370,001,390.22 | 45,850,207.48 |
| ඒකාබද්ධ අරමුදල | | (26,745,726.56) | (32,605,551.12) |
| ***ජංගම නොවන වගකීම්*** | | ***5,426,693.20*** | ***4,676,583.60*** |
| විශ්‍රාම පාරිතෝෂිත වගකීම් | | 2,926,693.20 | 2,176,583.60 |
| මධ්‍ය කාලීන ණය | | 2,500,000.00 | 2,500,000.00 |
| ***ජංගම වගකීම්*** | | ***7,137,748.15*** | ***8,188,392.46*** |
| කෙටි කාලීන ණය | | 375,000.03 | 479,166.68 |
| ණය හිමියන් | | - | 5,000.00 |
| රඳවාගත් මුදල් | | 256,669.35 | - |
| ගොවි අරමුදල් ණය | | - | 10,000.00 |
| උපචිත වියදම් | 11 | 6,506,078.77 | 7,694.225.78 |
| ***මුළු හිමිකම් හා වගකීම්*** | | **355,820,105.01** | **26,109,632.42** |

**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය**
**2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| විස්තරය | සටහන් | රු. 2014 | රු. 2013 |
|---|---|---|---|
| ***ආදායම්*** | | **50,048,316.74** | **33,598,140.69** |
| භාණ්ඩාගාර/අමාත්‍යාංශ ප්‍රදාන | | 25,516,568.00 | 16,166,164.94 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | | 23,968,173.48 | 16,210,261.08 |
| ඉතිරි කිරීම් ගිණුම්වල පොලිය | | 122,366.70 | 2,600.48 |
| වත්කම් ඉවත් කිරීමෙන් ලද මුදල | | 68,383.56 | |
| වෙනත් ආදායම් | | 372,825.00 | 1,219,114.19 |
| | | | |
| ***වියදම්*** | | **48,126,802.63** | **38,675,597.26** |
| පුද්ගල වේතන | | 20,237,177.46 | 18,316,913.27 |
| ගමන් වියදම් | | 79,955.00 | 308,104.50 |
| සැපයුම් සහ අවශ්‍යතා | | 1,669,799.53 | 2,143,240.98 |
| ස්ථාවර වත්කම් අළුත්වැඩියාව සහ නඩත්තුව | | 6,463,475.08 | 2,214,496.69 |
| පරිවර්තන, සන්නිවේදන, උපයුක්ත සහ වෙනත් සේවාවන් | | 19,676,395.56 | 15,692,841.82 |
| | | | |
| ***වියදම ඉක්මවූ ආදායම / අතිරික්තය (ඌනතාවය)*** | | **1,921,514.11** | **(5,077,456.57)** |

## ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය
## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2014 රු. | 2013 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාවන් (භාවිතා කරන) / ලැබෙන මුදල් ප්‍රවාහය** | | | |
| ආදායම් බදු වලට පෙර ශුද්ධ අලාභය | | 1,921,514.11 | (5,077,456.57) |
| ගැලපීම් | | | |
| ක්ෂය කිරීම් | 1 | 4,322,664.08 | 3,933,160.16 |
| ආයෝජන ක්‍රියාකාරකම් මගින් ඉපැයූ පොලී ආදායම | | (538,256.90) | (2,600.48) |
| විශ්‍රාමික පාරිතෝෂිත බැඳීම් සඳහා වෙන් කිරීම් | | 750,109.60 | 458,290.70 |
| කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය | | 6,456,030.89 | (688,606.19) |
| තොගය (වැඩිවීම්) / අඩුවීම් | | (5,134,402.52) | 4,135,059.38 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් (වැඩිවීම්) / අඩුවීම් | | 576,316.65 | 6,212,565.13 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දේ වල වැඩි කිරීම් | | (946,477.66) | (4,453,376.06) |
| මෙහෙයුම් මගින් ජනනය වූ මුදල් | | (5,504,563.53) | 5,894,248.45 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ලද ශුද්ධ මුදල් | | **951,467.36** | **5,205,642.26** |
| **ආයෝජන ක්‍රියාකාරකම් මගින් ලැබුණු / (භාවිතා කල) මුදල් ප්‍රවාහ** | | | |
| දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම් | 1 | (7,325,206.63) | (3,114,539.50) |
| දේපල, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය | | (328,671,316.14) | - |
| දේපල, පිරියත සහ උපකරණ ඉවත් කිරීම්/මාරු කිරීම් | | 6,129,390.12 | - |
| ආයෝජන ක්‍රියාකාරම් මගින් ලැබෙන පොලී ආදායම් | | - | 2,600.48 |
| ආයෝජන ක්‍රියාකාරකම් / (භාවිතා කල) මගින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | | **(329,867,132.65)** | **(3,111,939.02)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මගින් ලද / (භාවිතා කල) මුදල් ප්‍රවාහ** | | | |
| අරමුදල් ලැබීම් | | 30,516,568.00 | 18,976,164.94 |
| ආධාර මුදල් | | (25,516,568.00) | (16,166,164.94) |
| පෙර කාලච්ඡේද ගැලපීම් | | (5,581,822.95) | (3,495,770.88) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය/ඌණතාවය | | 328,671,316.14 | - |
| ණය ලැබීම් | | - | - |
| ණය නැවත ගෙවීම් | | (104,166.65) | (2,041,666.84) |
| | | **327,985,326.54** | **(2,727,437.72)** |
| මුදල් සහ මුදල් වලට සමාන දේ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | (930,338.74) | (633,734.37) |
| වර්ෂය මුලදී තිබූ මුදල් සහ මුදල් වලට සමාන දේ | | 1,000,105.15 | 1,633,839.52 |
| වර්ෂය අවසානයේදී තිබූ මුදල් සහ මුදල් වලට සමාන දේ | | **69,766.41** | **1,000,105.15** |
| **සටහන - A** | | | |
| බැංකු ශේෂය | | 918,739.46 | 1,319,615.48 |
| සුළු මුදල් අග්‍රිමය | | 80,214.96 | 313,073.31 |
| අත ඉතිරි මුදල් | | 1,150.73 | 1,150.73 |
| | | **1,000,105.15** | **1,633,839.52** |

**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය**
**2014 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

| | අරමුදල් ශේෂය | | ඒකාබද්ධ අරමුදල | | එකතුව |
|---|---|---|---|---|---|
| 01.01.2014 දිනට ශේෂය | 45,850,207.48 | | (32,605,551.12) | | 13,244,656.36 |
| | | | | | |
| ලැබුණු අරමුදල් | 30,516,568.00 | | | | 30,516,568.00 |
| | | | | | |
| ආධාර මුදල් | (25,516,568.00) | | | | (25,516,568.00 ) |
| | | | | | |
| පෙර කාලච්ඡේද ගැලපීම් | (9,520,133.40) | | 3,938,310.45 | | (5,581,822.95) |
| | | | | | |
| ඌන වෙන් කිරීම් | 328,671,316.14 | | | | 328,671,316.14 |
| | | | | | |
| වසර සඳහා ශුද්ධ අතිරික්තය (ඌනතාව) | | | 1,921,514.11 | | 1,921,514.11 |
| | **370,001,390.22** | | **(26,745,726.56)** | | **343,255,663.66** |

## සටහන 01
## ජංගම නොවන වත්කම්

| වත්කම් වර්ගය | ඉඩම් සහ ගොඩනැගිලි | මෝටර් වාහන | යන්ත්‍රෝපකරණ සහ උපකරණ | කාර්යාලීය උපකරණ | ලී බඩු සහ සවිකිරීම් | කෘෂි උපකරණ | උද්‍යාන උපකරණ | වෙනත් උපකරණ | ඡායාරූප සහ සිනමා උපකරණ | තාවකාලික ගොඩනැගිලි | සුළු උපකරණ | මැනීම් උපකරණ | පරිගණක සහ මෘදුකාංග | වෙනත් ආයෝජන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2014.01.01 ට ශේෂය | 4,759,997.84 | 2,381,167.56 | 4,452,666.31 | 1,353,178.45 | 747,777.28 | 29,520.45 | 61,102.91 | 583,811.49 | 26,310.00 | 1,129,224.26 | - | - | 2,077,363.68 | 50,750.76 | 17,652,870.99 |
| එකතු කිරීම් | 2,219,358.00 | - | 1,732,999.00 | 1,367,066.50 | 93,620.00 | - | - | | | 1,579,163.13 | | | 633,000.00 | | 7,625,206.63 |
| ඉවත් කිරීම් / මාරු කිරීම්(ස්ථාවර වත්කම්) | (6,450,456.46) | 37,605.00 | (6,248,734.09) | (1,385,290.87) | 1,019,172.71 | 215,634.85 | (223,209.85) | 3,800,905.39 | (400,833.92) | (894,706.70) | (78,804.00) | 266,705.01 | 455,653.20 | (178,153.80) | (10,064,513.53) |
| ඉවත් කිරීම් / මාරු කිරීම්(මෙතෙක් ක්ෂය කර ඇති අගයන්) | 1,690,458.61 | (37,605.00) | 3,804,216.94 | 913,299.46 | (698,093.51) | (176,009.25) | 175,780.14 | (2,246,826.21) | 400,833.92 | 524,953.14 | 78,804.00 | (219,638.22) | (402,453.65) | 127,403.04 | 3,935,123.41 |
| වර්ෂය සඳහා ක්ෂය වීම් | (279,780.82) | (885,840.00) | (1,829,903.35) | (368,707.12) | (129,069.42) | (10,367.00) | (13,673.20) | (125,631.52) | (22,770.00) | (107,557.72) | | | (549,363.93) | | (4,322,664.08) |
| ශුද්ධ ප්‍රත්‍යාගණනය | 318,300,000.00 | 7,211,672.44 | 1,460,555.19 | 136,619.08 | 295,112.94 | 580,720.95 | - | 427,090.85 | | 8,910.78 | | 83,673.21 | 166,960.70 | | 328,671,316.14 |
| **2014.12.31 දිනට ශුද්ධ අගය** | **320,239,577.17** | **8,707,000.00** | **3,371,800.00** | **2,016,165.50** | **1,328,520.00** | **639,500.00** | **0.00** | **2,439,350.00** | **3,540.00** | **2,239,986.89** | **-** | **130,740.00** | **2,381,160.00** | **-** | **343,497,339.56** |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ එකතුව | 311,158,330.70 | | | | | | | | | | | | | | 311,158,330.70 |
| ප්‍රත්‍යාගණන ඌණතාවයේ එකතුව | - | (2,224,494.81) | (5,911,725.26) | (3,836,765.63) | (1,757,428.93) | (2,092,608.37) | - | (3,577,833.80) | (14,160.00) | (67,463.24) | - | (279,815.01) | (1,428,831.20) | - | (21,191,126.25) |
| දළ ධාරණ වටිනාකම | 320,519,357.99 | 8,707,000.00 | 3,371,800.00 | 2,016,165.50 | 1,328,520.00 | 639,500.00 | - | 2,439,350.00 | 3,540.00 | 2,239,986.89 | - | 130,740.00 | 2,381,160.00 | - | 343,777,120.38 |
| සමුච්චිත ක්ෂයවීම් | (279,780.82) | - | - | - | - | - | - | | | | | | | | (279,780.82) |
| **ශුද්ධ ධාරණ වටිනාකම** | **320,239,577.17** | **8,707,000.00** | **3,371,800.00** | **2,016,165.50** | **1,328,520.00** | **639,500.00** | **-** | **2,439,350.00** | **3,540.00** | **2,239,986.89** | **-** | **130,740.00** | **2,381,160.00** | **-** | **343,497,339.56** |

**සටහන 12 :වෙළඳ හා ලාභ අලාභ ගිණුම්**

12.1 **දෙහිවල අලෙවි සැල**

**2014.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ ගිණුම**

| අයිතම | 2014 රු. | 2013 රු. |
|---|---|---|
| වෙළඳ ආදායම | **47,285,238.21** | **54,795,215.59** |
| අඩුකලා: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | 1,620,879.72 | 1,382,949.40 |
| මිලදී ගැනීම් | 38,830,172.31 | 45,232,653.06 |
| ප්‍රවාහන | 60,780.00 | 50,110.00 |
| තොග හානි | - | (4,035.00) |
| අවසාන තොගය | (1,832,983.42) | (1,240,388.97) |
| | 38,678,848.61 | 45,421,288.49 |
| **දළ ලාභය** | **8,606,389.60** | **9,373,927.10** |
| | **38,830,172.31** | **45,232,653.06** |
| **පොදු කාර්ය පිරිවැය** | **6,121,579.19** | **6,937,906.74** |
| **ශුද්ධ ලාභය** | **2,484,810.41** | **2,436,020.36** |

12.2 **අලෙවි සැල, පැල තවාන සහ ප්‍රධාන කාර්යාලය**

**2014.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ ගිණුම**

| **අයිතම** | **2014** රු. | **2013** රු. |
|---|---|---|
| වෙළඳ ආදායම | **6,378,381.02** | **4,737,775.45** |
| අඩුකලා: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | 403,350.00 | 719,006.98 |
| මිලදී ගැනීම් | 4,411,191.00 | 4,155,646.00 |
| තොග හානි | | (3,932.00) |
| අවසාන තොගය | (456,182.00) | (403,350.00) |
| | 4,358,359.00 | 4,467,370.98 |
| **දළ ලාභය** | **2,020,022.02** | **270,404.47** |
| පොදු කාර්ය පිරිවැය | 1,708,337.83 | 914,573.76 |
| **ශුද්ධ ලාභය** | **311,684.19** | **(644,169.29)** |

12.3 **වතුකරයේ සහල් පිටි භාවිතය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය - කලංකුට්ටිය**
**2014.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා නිෂ්පාදන, වෙළඳ ගිණුම**

| **අයිතමය** | **2014** රු. | **2013** රු. |
|---|---|---|
| ආරම්භක තොගය | 750,058.10 | 2,722,142.40 |
| මිලදී ගැනීම් | 11,307,072.72 | 6,877,327.80 |
| තොග හානි | (59,612.60) | |
| අවසන් තොගය - ද්‍රව්‍ය | (3,352,991.90) | (750,058.10) |
| අමුද්‍රව්‍ය සඳහා වියදම | 8,644,526.32 | 8,849,412.10 |
| සෘජු වැටුප් | 1,383,456.67 | 2,573,031.36 |
| ප්‍රවාහන වියදම් | 20,231.42 | |
| ආරම්භ තොගය - නොනිමි වැඩ | - | 186,314.70 |
| අවසන් තොගය - නොනිමි වැඩ | - | - |
| නිෂ්පාදන වියදම් | 10,048,214.41 | 11,608,758.16 |
| විකුණුම් ආදායම | **14,300,287.00** | **13,249,247.25** |
| අඩු කලා: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොගය | 11,204.00 | 196,989.20 |
| නිෂ්පාදන වියදම් | 10,048,214.41 | 11,608,758.16 |
| | 10,059,418.41 | 11,805,747.36 |
| අවසන් තොගය | (67,400.00) | (11,204.00) |
| | 9,992,018.41 | 11,794,543.36 |
| **දළ ලාභය** | **4,308,268.59** | **1,454,703.89** |
| **පොදු කාර්ය පිරිවැය** | **180,347.14** | **1,407,874.98** |
| **ශුද්ධ ලාභය** | **4,127,921.45** | **46,828.91** |

12.4 **සුවපෝෂ නිෂ්පාදන කර්මාන්ත ශාලාව - ගන්නෝරුව**

**2014.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ ගිණුම**

| අයිතමය | 2014 රු. | 2013 රු. |
|---|---|---|
| ආරම්භක තොග | 458,574.00 | 344,235.75 |
| මිලදී ගැනීම් | 6,513,780.35 | 3,121,551.00 |
| අවසන් තොග - අමු ද්‍රව්‍ය | (999,592.55) | (458,574.00) |
| අමුද්‍රව්‍ය සඳහා වියදම | 5,972,761.80 | 3,007,212.75 |
| සෘජු වැටුප් | 358,378.45 | 295,887.50 |
| ප්‍රවාහන වියදම් | 22,100.00 | - |
| ආරම්භක තොග - නොනිමි වැඩ | - | - |
| අවසන් තොග - නොනිමි වැඩ | - | - |
| නිෂ්පාදන පිරිවැය | 6,353,240.25 | 3,303,100.25 |
| විකුණුම් ආදායම | **8,493,152.50** | **5,412,925.00** |
| අඩු කලා: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොග | 10,000.00 | 565,920.00 |
| නිෂ්පාදන පිරිවැය | 6,353,240.25 | 3,303,100.25 |
| | 6,363,240.25 | 3,869,020.25 |
| අවසන් තොගය | (155,950.00) | (10,000.00) |
| | 6,207,290.25 | 3,859,020.25 |
| **දළ ලාභය** | **2,285,862.25** | **1,553,904.75** |
| පොදු කාර්ය පිරිවැය | 295,328.89 | 844,678.55 |
| **ශුද්ධ ලාභය** | **1,990,533.36** | **709,226.20** |

12.5 **හෙල්දි ෆුඩ් භොජනාගාරය**

**2014.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ ගිණුම**

| **අයිතම** | **2014 රු.** |
|---|---|
| විකුණුම් ආදායම | **16,395,350.08** |
| අඩුකලා: විකුණුම් පිරිවැය | |
| ආරම්භක තොගය | - |
| මිලදී ගැනීම් | 14,308,582.42 |
| වැටුප් | 2,793,551.79 |
| ප්‍රවාහන | - |
| අවසන් තොග | (212,587.15) |
| | 16,889,547.06 |
| **දළ ලාභය** | **(494,196.98)** |
| පොදු කාර්ය පිරිවැය | 1,008,816.88 |
| **ශුද්ධ ලාභය** | **(1,503,013.86)** |

12.6 **මව්පෝෂ ව්‍යාපෘතිය**

**2014.12.31න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ, ලාභ සහ අලාභ ගිණුම**

| **අයිතම** | **2014 රු.** | **2013 රු.** |
|---|---|---|
| ආරම්භක තොග | 576,998.00 | 444,209.02 |
| මිලදී ගැනීම් | 9,439,396.43 | 8,158,053.00 |
| සෘජු වැටුප් | 3,966,875.34 | 1,529,221.95 |
| ප්‍රවාහන | 752,393.00 | 432,359.00 |
| අවසන් තොග - අමු ද්‍රව්‍ය | (1,681,715.46) | (576,998.00) |
| | 13,053,947.31 | 9,986,844.97 |
| අවසන් තොග - නොනිමි වැඩ | - | - |
| නිෂ්පාදන පිරිවැය | 13,053,947.31 | 9,986,844.97 |
| විකුණුම් ආදායම | **19,201,680.00** | **13,130,423.00** |
| අඩු කලා: විකුණුම් පිරිවැය | | |
| ආරම්භක තොග | 14,220.00 | 566,720.00 |
| නිෂ්පාදන පිරිවැය | 13,053,947.31 | 9,986,844.97 |
| | 13,068,167.31 | 10,553,564.97 |

| | | |
|---|---|---|
| අවසන් තොගය | (671,040.00) | (14,220.00) |
| | 12,397,127.31 | 10,539,344.97 |
| **දළ ලාභය / අලාභය** | **6,804,552.69** | **2,591,078.03** |
| පොදු කාර්ය පිරිවැය | 1,323,082.08 | 2,167,776.77 |
| **ශුද්ධ ලාභය** | **5,481,470.61** | **423,301.26** |

12.7 **බුත්තල කොම්පෝස්ට්**
**2014.12.31න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ, ලාභ සහ අලාභ ගිණුම**

| **අයිතම** | **2014**<br>**රු.** |
|---|---|
| ආරම්භක තොග | - |
| වගා කිරීමේ පිරිවැය | 217,924.69 |
| සෘජු වැටුප් | - |
| ප්‍රවාහන | - |
| අවසන් තොග - අමු ද්‍රව්‍ය | (136,460.00) |
| | 81,464.69 |
| ආරම්භක තොග - නොනිමි වැඩ | - |
| අවසන් තොග - නොනිමි වැඩ | - |
| නිෂ්පාදන පිරිවැය | 81,464.69 |
| විකුණුම් ආදායම | **476,090.00** |
| අඩු කලා: විකුණුම් පිරිවැය | |
| ආරම්භක තොග | - |
| නිෂ්පාදන පිරිවැය | 81,464.69 |
| අවසන් තොගය | (42,650.00) |
| | **38,814.69** |
| **දළ ලාභය / අලාභය** | **437,275.31** |
| පොදු කාර්ය පිරිවැය | **280,381.43** |
| **ශුද්ධ ලාභය** | **156,893.88** |

**වෙළඳ හා ලාභ අලාභ ගිණුම්**

| | |
|---|---|
| දෙහිවල අලෙවි සැල | 8,606,389.60 |
| පැල තවාන | 2,020,022.02 |
| කලංකුට්ටිය සහල් පිටි ව්‍යාපෘතිය | 4,308,268.59 |
| සුවපෝෂ ව්‍යාපෘතිය | 2,285,862.25 |
| හෙල්දි ෆුඩ් | (494,196.98) |
| මව්පෝෂ ව්‍යාපෘතිය | 6,804,552.69 |
| බුත්තල කොම්පෝස්ට් | 437,275.31 |
| **එකතුව** | **23,968,173.48** |

18. සෘජු සංවර්ධන වියදම් ආධාර මුදල් යටතේ දක්වා ඇත.

19. ප්‍රධාන කාර්යාලයේ පරිපාලනය සඳහා දැරූ සියළුම වියදම් භාණ්ඩාගාර අරමුදල් යටතේ දක්වා ඇත.

20. භාණ්ඩාගාර අරමුදල්

| විස්තරය | අයවැය වෙන් කිරීම | 2013 සත්‍ය වියදම් | 2013 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන | ඉතිරිය/ ඌනතාවය |
|---|---|---|---|---|
| පුනරාවර්ථන | 26,948,745.33 | 19,111,074.35 | 16,500,000.00 | 7,837,670.98 |
| ප්‍රාග්ධන | 5,000,000.00 | 5,233,724.34 | 5,000,000.00 | (233,724.34) |
| | | | 21,500,000.00 | |

21. කෙසේ වෙතත් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ව්‍යාපෘති සඳහා ලැබුණු අරමුදල් පහත සඳහන් පරිදි පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් ලෙස භාවිතා කරන ලදි.

| විස්තරය | ප්‍රාග්ධන | පුනරාවර්තන | එකතුව |
|---|---|---|---|
| ව්‍යාපෘති | - | 9,016,568.00 | 9,016,568.00 |
| | | | **9,016,568.00** |

22.. අම්බලන්තොට ගොවිපලේ ඉදිකරන ලද වැට සඳහා ගෙවීමට නියමිත රු. 3,209,728.53 ක මුදල සඳහා කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු අංක DMR 02401-13 යටතේ මේ වන විටත් විභාග වෙමින් පවතී.

# 2014 විගණන වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. LP/D/HCB/1/14/05 මබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2015 ඔක්තෝබර් ෆ දින

සභාපති

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය

**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතේ 14 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මත සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ඉදිරිපත්කර ඇති තොරතුරු අනුව මණ්ඩලය වෙත රු.41,330,074 ක රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ලැබී තිබූ අතර එය වෙනම ගිණුමක් මඟින් හෙළිදරව් කර නොතිබුණි.මෙම ප්‍රතිපාදන උපයෝගී කරගෙන අත්පත් කරගත් වත්කම් පිළිබඳ වාර්තා පවත්වා නොතිබූ අතර එම වත්කම් ක්ෂය කර තිබූ නමුත් ක්‍රමක්ෂය කිරීම පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තියක් ද හඳුන්වා දී නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ප්‍රකාරව ඉකුත් වර්ෂවලට අදාල වැරදි නිවැරදි කිරීම් අතීතානුකූලව ගලපා ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්ත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීමට කටයුතු නොකර රු.9,520,133 ක හා රු. 3,938,310 ක හර සහ බැර සටහන් පිළිවෙලින් රාජ්‍ය ප්‍රදාන හා සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

3

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1999 වර්ෂයේදී මණ්ඩලයට අයිතිය පවරා ගෙන තිබුණු නාරාහේන්පිට පිහිටි හෙක්ටයාර් 0.2022 ක ඉඩමේ වටිනාකම අගයකර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම නිසා ඇති වී තිබුණු රු.328,671,316 ක ප්‍රත්‍යාගණන අතිරික්තය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ වෙනම පෙන්නුම් කළයුතු වුවද අරමුදල් ශේෂයට එකතුකර දක්වා තිබුණි.

2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නිසා 2011 වර්ෂයේ සිට පැවත එන රු.691,212 ක්වූ වෙළඳ ණයගැති ශේෂය අයකර ගැනීමට මණ්ඩලය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අපොහොසත් වී තිබුණි.

(ආ) රේඛීය අමාත්‍යංශයෙන් අයවිය යුතු වසර 05 කට වඩා පැරණි රු.34,233 ක ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සහල් ව්‍යාපෘතිය යටතේ 2013 වර්ෂයේදී ණය පදනම මත බාහිර පුද්ගලයෙකුට සපයා තිබුණු හාල් පිටි තොගයක් වෙනුවෙන් අයවිය යුතුව තිබූ රු.80,328 ක් 2015 අගෝස්තු 20 දින දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4

2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 110 | හානි හා පාඩු ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 756 | 2014 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතුව වාහන 15 ක් පැවතියද මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 772 | සමාලෝචිත වර්ෂයේදී සිදුව තිබූ රු.59,612 ක තොග හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 02 ඡේදයේ (ඇ) හා (ඉ) ඡේද | ස්ථාවර වත්කම් සඳහා ප්‍රධාන ලෙජරයේ පාලන ගිණුමක් පවත්වා ගෙන ලෙජර් ගිණුම් එම පාලන ගිණුම සමඟ සැසඳීමක් කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

5

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,921,514 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.5,077,456 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,998,970 ක වර්ධනයක් පෙන්නුම්කළ අතර පුද්ගල පඩිනඩි හා වෙනත් වියදම් රු.10,152,795 කින් වැඩි වී තිබුණද රාජ්‍ය ප්‍රදාන හා වෙනත් ආදායම් රු.17,108,316 කින් වැඩිවීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්වයං අරමුදලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති 06 කින් රු.14,553,313ක ශුද්ධ ලාභයක් හා ව්‍යාපෘතියකින් රු.1,503,014 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසයේ ආරම්භකර තිබුණු හෙල්දිවුඩ භෝජනාගාරයෙන් 2014 දෙසැම්බර් දක්වා කාලය තුළ රු. 1,503,014 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණු අතර මුළු වියදමින් සියයට 73 ක ප්‍රතිශතයක් වැටුප් හා වේතන වියදම් වීම මෙම ශුද්ධ අලාභයට හේතු වී තිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොවිහාර අරමුදලින් 2010වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලය තුල අවස්ථා 3 කදී ලබා ගෙන තිබූ රු.3,500,000 ක ණය මුදල 2013 වර්ෂ තුළ ගෙවා අවසන් කළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ණය මුදලින් රු. 625,000 ක් පමණක් ආපසු ගෙවා තිබුණි.

(ආ) 2000 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලයට අදාල රු.751,514 ක්වූ විගණන ගාස්තු 2015 අගෝස්තු 15 දින දක්වාම පියවා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතට අනුව රජයේ සංවර්ධන වැඩ පිළිවෙලට අනුකූලව සාමාජික හා ආර්ථික සංවර්ධනය සඳහා විදේශීය හා දේශීය නියෝජ්‍යත්ව වලින් ආධාර ලබා ගැනීමට සහ ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාර සහ වෙනත් ඒ හා සමාන විදේශ ආයතන, සංගම් හෝ සමිති සමඟ සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

4.3 කාර්යමණ්ඩල පරිපාලනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 නොවැම්බර් 27 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී බඳවා ගැනීමේ පරිපාටියේ ඇති සුදුසුකම් සපුරාලන, සුදුසු සේවකයින් බඳවා ගැනීම සඳහා සභාපතිවරියට බලය පවරා තිබුණු නමුත් බඳවා ගැනීමේ කාර්ය පටිපාටියට පටහැනිව කළමනාකරණ සහකාරවරු දෙදෙනෙකු හිටපු සභාපතිවරිය විසින් බඳවා ගෙන තිබුණි.

(ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන තිබුණු , තනතුරු වල අඛණ්ඩව දින 180 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ලබා දිය යුතු වුවද අඛණ්ඩව දින 180 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති කොන්ත්‍රාත් පත්වීම්ලාභීන් 07 දෙනෙකු වෙත 2014 නොවැම්බර් 18 දින ස්ථිර පත්වීම් ලබා දී තිබුණි.

7

(ඈ) මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 28 ක් වුවත් ඉහත චක්‍රලේඛය ප්‍රකාරව සේවකයින් 50 ක් ස්ථිර කිරීම නිසා තථ්‍ය කාර්යමණ්ඩලය 50 කින් ඉක්මවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම අනුව අම්බලන්තොට ගොවිපලෙහි ගොඩනැගිලි අලුත්වැඩියාව, වගා ළිඳක් සෑදීම හා අක්කර 08 ක මුං වගාකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2.46 ක ප්‍රතිපාදන සලසා තිබුණද එම කාර්යයන් සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබුණි.

(ආ) තණමල්විල ගොවිපලේ රු.600,000 ක් වැයකර වාරිමාර්ග කටයුතු සිදුකිරීමට හා රු.1,454,000 ක් වැයකර අලිවැටක් ඉදිකිරීමට සමාලෝචිත වර්ෂයේ දී සැලසුම් කර තිබුණද එම කටයුතු සිදුකර නොතිබුණි.

### 5.2 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් පරීක්ෂාවේදී වියදමේ සියයට 2.3 සිට සියයට 232 දක්වා ප්‍රමාණවත් විචලනයන් අනාවරණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(ආ) අයවැය ලේඛනය, ක්‍රියාකාරී සැලැස්ම හා තථ්‍ය කාර්යසාධනය සමඟ කාලානුරූපව සමාලෝචනය කර විචලනයන් පිළිබඳ පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

5.3 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 වර්ෂයේදී ගොවීන් 19 ක් වෙත ගොවිබිම් සඳහා ජලය සැපයීමේ යන්ත්‍ර ලබාගැනීම සඳහා ලබා දෙන ලද රු. 80,610 ක ණය මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද පියවර ගෙන නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව මණ්ඩලයට නීත්‍යානුකුල අයිතියක් නොමැති ඉඩමක වැටක් හා ගේට්ටුවක් ඉදිකිරීම සඳහා රු. 2,548,050 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් නීත්‍යානුකුල නොවන අයුරින් බාහිර පාර්ශවයකට පිරිනමා තිබුණි. වැඩ අවසන් කර තිබුණද කොන්ත්‍රාත්කරුට මණ්ඩලය මුදල් නොගෙවීම නිසා රු.3,209,728 ක වන්දි මුදලක් ගෙවන ලෙසට කොන්ත්‍රාත්කරු විසින් නීතිඥ ආයතනයක් මගින් මණ්ඩලයට එරෙහිව 2013 දෙසැම්බර් 31 දින එන්තර වාසියක් එවා තිබුණු අතර ඊට අදාල නඩු විභාගය 2015 අගෝස්තු 28 දින දක්වාම අවසන් වී නොතිබුණි.

(ඇ) හිටපු උපසභාපතිවරයා විසින් 2011 වර්ෂයේදී ණය පදනම මත රු. 64,500 වටිනා සුව පෝෂ හා මව්පෝෂ පැකට් ලබා ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එම මුදල් ඔහුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) නිලධාරීන් 09 දෙනෙකු විසින් ලබාගෙන තිබූ රු. 42,080 ක විවිධ ණය හා අත්තිකාරම් ශේෂයන් වසර 10 ක සිට හිඟ හිට පැවති නමුත් එම මුදල් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඉ) 2011 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලයට ගෙවියයුතු රු.3,300,000 ක් නිරවුල් කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඊ) 2012 ඔක්තෝබර් 01 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නිර්දේශ කර තිබුණු පරිදි මණ්ඩලයේ සංශෝධිත පනත 2015 අගෝස්තු 28 දින දක්වාම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.

9

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(උ) 2012 වර්ෂයේදී නාරාහේන්පිට අලෙවිසැලේ සිදු වී තිබූ රු.77,352 ක මුදල් සොරකම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාර කටයුතු කර නොතිබුණි. තවද මෙම අලෙවිසැලේ මුදල් අයකැමියන් ලෙස සේවය කළ කාර්යාල කාර්යය සහායකයින් තිදෙනාට එම තනතුරේ කටයුතු කිරීම සඳහා ලිඛිත පැවරුමක් කිරීමටත් ඔවුන්ගෙන් ඇප ලබා ගැනීමටත් කටයුතු කර නොතිබුණි

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ කෙටියෙන් |
|---|---|---|
| (අ) | මූල්‍ය පාලනය | අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර ප්‍රමාණවත් විචලනයන් අනාවරණය වීම හා ණය නිරවුල් කිරීමට කටයුතු නොකිරීම |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව කාර්ය මණ්ඩලය බඳවා ගෙන තිබුණි. |
| (ඇ) | ව්‍යාපෘති කළමනාකරණය | සැලසුම් කල පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හා ව්‍යාපෘති අලාභ ලැබීම |
| (ඈ) | වත්කම් පාලනය | මණ්ඩලයට අයත් ඉඩම් අගය කර ගිණුම් ගත කිරීමට පියවර නොගැනීම |
| (ඉ) | කොන්ත්‍රාත් පරිපාලනය | මණ්ඩලයට අයිතියක් නොමැති ඉඩම්වල ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් පිරිනමා තිබීම |

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

10